“ආශිර්වාද දෙකක් ඇත. ජනයා අතරින් බහුතරයක් දෙනා ඒ දෙක ගැන නොසැලකිල්ලෙන් පසුවෙති. ඒවානම්: නිරෝගීකම හා විවේකයයි.”

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී: “ආශිර්වාද දෙකක් ඇත. ජනයා අතරින් බහුතරයක් දෙනා ඒ දෙක ගැන නොසැලකිල්ලෙන් පසුවෙති. ඒවානම්: නිරෝගීකම හා විවේකයයි.”
[صحيح] [رواه البخاري]

මිනිසාට අල්ලාහ් පිරිනැමූ අතිමහත් ආශිර්වාද දෙකක් පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ. බහුතරයක් දෙනා නියමිත නොවන ස්ථානයේ ඒවා වැය කරන බැවින් ඒ තුළ ඔවුහු පාඩු ලබති. සැබැවින්ම මිනිසාට විවේකය සමග නීරෝගිභාවයේ ආශිර්වාදය එකට බැඳී තිබුණු විටක නැමදුම් කිරීමට දක්වන මැලිභාවය ඔහු අබිබවා යනු ඇත. එවිට ඔහු පාඩු ලබන්නෙකු වේ. බහුතරයකගේ තත්ත්වය මෙයයි. ඔහුගේ විවේක කාලය හා නිරෝගී සම්පන්න බව අල්ලාහ්ට නැමදුම් කිරීමෙහි ඔහු යොදා ගන්නේ නම් එය ඔහුට ලාබයක් වනු ඇත. සැබැවින්ම මෙලොව මතුලොවෙහි ගොවිබිමයි. මතුලොවෙහි සුවඳ හමන ව්යාපාරය එහි ඇත. විවේකය කාර්යබහුලතාවයෙන් පසු පැමිණෙයි. එමෙන්ම නීරෝගී භාවය ව්යාධියෙන් පසු පැමිණෙයි. ඔහුට වයෝවෘද්ධභාවය හැර වෙනත් යමක් නොවී නම් එය ඔහුට ප්රමාණවත් වේ.

https://sunnah.global/hadeeth/si/show/5449